මගේ අංකය / எனது இல / My No: DSD/HO/13/FDP
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2019.04.10

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>සමෘද්ධිලාභීන් යැපීම් මානසිකත්වයෙන් මුදවා ,ඉහළ ආදායම් ලබන්නකු බවට පත් කිරීම සඳහා සවිබල ගැන්වීමට අදාල ක්‍රමවේදය</u>**

**"සමෘද්ධිලාභීන් දුප්පතුන් ලෙස ඉපදීම ඔවුන්ගේ වරදක් නොවේ. නමුත් ඔවුන් දුප්පතුන් ලෙසම මියයන්නේ නම් ඒ සඳහා ඔවුන් හා අපද වගකිය යුතු වන්නේය".** එබැවින් සමෘද්ධිලාභීන් යැපීම් මානසිකත්වයෙන් මුදවා ගැනීම සඳහා ඔවුන් දැනුවත් කරමින්, ඔවුන්ගේ ශක්තීන් හඳුනාගෙන සංවර්ධනය කිරීමටත් දුර්වලතා හඳුනාගෙන ඒවා අවමකිරීමටත් ඔවුන්ගේ අවස්ථා හඳුනාගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීමටත් ඔවුන් මුහුන දී ඇති තර්ජන හඳුනාගෙන ඒවා අවමකිරීමට හා මුහුණදීමට හුරුකිරීම සඳහාත් ,ඔවුන් දේශීය ව්‍යවසායකයින් බවට පත්කිරීමට විපර්යකාරක පුහුණු වැඩසටහන හා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන ට අදාලව ප්‍රාදේශීය පුහුණුකරුවන් හා දිස්ත්‍රික් පුහුණුකරුවන් 2018 වර්ෂයේ පුහුණු කරන ලදී.

විපර්යකාරක පුහුණු වැඩසටහන යටතේ සවිබලගැන්වීමේ පලමු පියවර ලෙස වසමේ හදුනාගත් පවුල් සඳහා පවුල් සංවර්ධන සැලසුම් සකස්කළ යුතු වේ.එසේ පවුල් සංවර්ධන සැලසුම් සකස් කරමින් සවිබලගැන්වීමේ පියවරයන් පසුකරන, ව්‍යාපාරික අදහස් ඇති ප්‍රතිලාභීන් ව්‍යවසායකයකු කරමින් , ආර්ථික සවිබලගැන්වීම උදෙසා , ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන යටතේ ලබා ගත් දැනුම භාවිතා කරමින් කුඩා ව්‍යාපාර සැලසුම් සකස් කරමින් එම ප්‍රතිලාභීන්ට උපදෙස් හා මඟපෙන්වීම් ලබා දිය යුතුය. ප්‍රතිලාභීන් යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීමේ කාර්යය විපර්යකාරක වැඩසටහන යටතේ සිදුකළ යුතුය.ප්‍රතිලාභීන් ව්‍යවසායකයකු කිරීමේ කාර්යය ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන යටතේ සිදුකළ යුතුය.

එසේම සවිබලගැන්විය හැකි සමෘද්ධිලාභී පවුල්වල වත්කම් වැඩි කිරීමටත් අනවශ්‍ය වගකීම් අවමකිරීමටත්, එම පවුල්වල ආදායම් වැඩිකර වියදම් අවම කර ගනිමින් (අනවශ්‍ය වියදම් කපාහරිමින්) එම පවුල් වල ශක්තීන් හා අවස්ථා වැඩිකරලීමට කටයුතු කිරීම තුළින් ඉහළ ආදායම් ලබන පවුල් බවට පත් කිරීමට ඔවුන් උනන්දු කරවීම සමෘද්ධි සංවර්ධන නිළධාරින්ගේ භූමිකාව වේ. සමෘද්ධි සංවර්ධන නිළධාරින්ට මෙම කාර්යය පහසු කරවීම සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පුහුණුකරුවන් විසින් නිරන්තර පුහුණුවීම් අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදුකළ යුතුය.

මේ සමඟ අමුනා ඇති ආකෘති පත්‍ර අනුව FDPV 01 සමෘද්ධි සංවර්ධන නිළධාරි ළඟ තබා ගත යුතු වාර්තාවක් සකස් කර FDPV 2.1 නිර්නායක අනුව සකස් කල FDPV 2 ආකෘතිය සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් සමෘද්ධි කලාප කලමනාකරු වෙත මාසිකව ලබා දිය යුතුය. සමෘද්ධි කලාප කලමනාකරු විසින් FDPV 2 ආකෘතිය පදනම් කරගෙන

FDPz 3 පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ කලාපීය ප්‍රගතිය සකස් කර ,බ්‍රහස්පතින්දා දින පැවැත්වෙන සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ කලාපීය සති ප්‍රගති සමාලෝචනයේදී කලාප කලමනාකරු විසින් ප්‍රගතිය සාකච්ජා කළ යුතු අතර, එය ඔහුගේ/ඇයගේ සමෘද්ධි දෙපාර්තමේන්තු වගකීම වේ. ඉන්පසුව FDPz 3 වාර්තාව සමෘද්ධි බැංකු සමිතියේ කළමනාකරු ට හා මූලස්ථාන කළමනාකරු වෙත පිටපත් දෙකක් ලබා දිය යුතුය.

FDPV 3 ආකෘතිය පදනම් කරගෙන FDPD 4 පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ ප්‍රා.ලේ. කොට්ඨාශ ප්‍රගතිය සකස් කර , සැම මසකම ප්‍රා.ලේ.කොට්ඨාශය තුල පැවැත්වෙන සමෘද්ධි මාසික ප්‍රගති සමාලෝචනයේදී ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රගතිය සාකච්ජා කල යුතුය. FDPD 4 ප්‍රගතිය අධීක්ෂණ හා පසු විපරම් කටයුතු සමෘද්ධි බැංකු සමිතියේ කළමනාකරු හා මූලස්ථාන කළමනාකරු විසින් සිදුකළ යුතු අතර එය ඔවුන්ගේ සමෘද්ධි දෙපාර්තමේන්තු වගකීම වේ. ඉන්පසුව FDPD 4 වාර්තාව සමෘද්ධි බැංකු සමිතියේ කළමනාකරු හා මූලස්ථාන කළමනාකරු විශ්ලේශනය කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.මෙම වාර්තාවේ පවතින තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ප්‍රාදේශීය පුහුණු සංචිතයේ නිළධාරින්ගේ සහය ලබාගත යුතුය.

FDPD 4 ආකෘතිය පදනම් කරගෙන FDP DIS 05 පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ දිස්ත්‍රික් ප්‍රගතිය සකස් කර , සැම මසකම දිස්ත්‍රික්කය තුල පැවැත්වෙන සමෘද්ධි මූලස්ථාන මාසික ප්‍රගති සමාලෝචනයේදී දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ප්‍රගතිය සාකච්ජා කල යුතුය. FDP DIS 05 ප්‍රගතිය අධීක්ෂණ හා පසු විපරම් කටයුතු දිස්ත්‍රික් සමෘද්ධි පුහුණු කළමනාකරුගේ හා ප්‍රාදේශීය පුහුණු සංචිතයේ නිළධාරින් විසින් සිදුකළ යුතු අතර එය ඔවුන්ගේ සමෘද්ධි දෙපාර්තමේන්තු වගකීම වේ. ඉන්පසුව FDP DIS 05 වාර්තාව සමෘද්ධි පුහුණු කළමනාකරු විසින් විශ්ලේශනය කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මානව සම්පත් සංවර්ධන වෙත ලබා දිය යුතුය. ඉන්පසුව FDP DIS 05 මෙම වාර්තාවේ පවතින තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහාත්, දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් වල ප්‍රතිඵල ඇගයීම සඳහාත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිටින ප්‍රාදේශීය පුහුණුකරුවන්, ප්‍රාදේශීය අධීක්ෂණ හා පසුවිපරම්කරුවන් වන බැවින්, ඔවුන් දිස්ත්‍රික් මට්ටමින් ත්‍රෛයි මාසිකව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය සිදුකරනු ඇත. ,

FDP DIS 05 ආකෘතිය පදනම් කරගෙන පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ FDPN 06 ජාතික ප්‍රගතිය සකස් කර , සැම මසකම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුල පැවැත්වෙන සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ මාසික ප්‍රගති සමාලෝචනයේදී සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රගතිය සාකච්ජා කිරීමට නියමිතය.දිස්ත්‍රිත් පුහුණු කළමනාකරුවන් සම්බන්ධ කර ගනිමින් FDPN 06 වාර්තාව පදනම් කරගෙන ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචනයද ත්‍රෛයි මාසිකව පැවැත්වීමට නියමිතය.

FDPN 06 ජාතික මට්ටමේ ප්‍රගති වාර්තාවේ පිටපතක් ක්ෂේත්‍ර පරීක්ෂාකිරිම සඳහා බොරැල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය වෙත සවිබලගැන්වීමේ වැඩසටහනේ සාර්ථක අසාර්ථක බව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්ෂේත්‍ර පරීක්ෂාකිරිම සඳහා ලබා දෙනු ඇත. ඒ අනුව බොරැල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්ෂේත්‍ර පරීක්ෂාකිරිම් සිදුකර ඒ පිළිබඳව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට, ඔවුන් වාර්තා කිරීමට කටයුතු කරනු ඇත.

මෙම සවිබලගැන්විය හැකි සමෘද්ධිලාභි පවුල් ව්‍යවසායකයකු දක්වා ගමන් කිරීමේදී ඔවුන් යැපුම් මානසිකත්වයෙන් මිදී සවිබලගැන්වූ පවුල් බවට පත් කළ හැකි වනු ඇත.සමෘද්ධිලාභී පවුල් හා එම පවුල් වල පුද්ගලයින් යැපීම් මානසිකත්වයෙන් මුදවාගැනීම සඳහා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පුහුණුකරුවන් නිරන්තරව වසම් මට්ටමින් ප්‍රජාව සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් මට්ටමේ නිළධාරීන් දැනුවත් කරන ලෙසත් ,ඔවුන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් විවිධ ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරණ ලෙසත් කාරුණිකව දන්වමි.

එසේම මේ සමඟ අමුනා ඇති ආකෘති අනුව ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන ප්‍රාදේශීය පුහුණුකරුවන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ත්‍රෛයි මාසිකව ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය.ඉන්පසුව එම ප්‍රගතිය පදනම් කරගෙන ත්‍රෛයිමාසිකව පැවැත්වෙන ජාතික මට්ටමේ ප්‍රගතිය සඳහා අවශ්‍ය තොරතුරුද රැගෙන පුහුණු විෂය භාර කළමනාකරු අදාල දිනයන්හී සමෘද්ධි දෙපාර්තමේන්තුවට පැමිණිය යුතුවේ.දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලදීද මේ පිළිබඳ සාකච්ජා කරනු ඇත. ප්‍රාදේශීය පුහුණුකරුවන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සවිබලගැන්වීමේ වැඩසටහන අධීක්ෂණය හා පසුවිපරම් කිරීම සිදුකළ යුතුය.ජාතික මට්ටමින් මෙම සවිබලගැන්වීමේ වැඩසටහනේ සාර්ථක අසාර්ථක බව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

මට්ටමින් ක්ෂේත්‍ර පරීක්ෂාකිරීම බොරළුල්ල ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් සිදුකර ත්‍රෛයිමාසිකව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට, ඔවුන් වාර්තා කිරීමට කටයුතු කරනු ඇත.

.

සවිබලගැන්විය හැකි පවුල් හා එම පවුල් වල පුද්ගලයින් සංවර්ධනය කිරීම සඳහා ඔබ දිස්ත්‍රික් මට්ටමින් ලබා දෙන නායකත්වයට අතිශයින් කෘතඥ වෙමි.

**එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර**
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : 01. ලේකම්.සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය - දැ. ගැ.ස

02. අධ්‍යක්ෂ, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ,බොරළුල්ල

**පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ විස්තර** (සමෘද්ධි සංවර්ධන නිළධාරි ළඟ තබා ගත යුතු වාර්තාවකි) **FDPV 01**

**වසම :**

**සමෘද්ධි බැංකුව :**

**ප්‍රා.ලේ.කොට්ඨාශය :** **අදාළ මාසය :**

| අනු අංකය | සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වන පවුලේ නම | පවුලේ මාසික ආදායම | පවුලේ මාසික වියදම | ශුද්ධ ලාභය | පවුලේ ආදායම් වැඩි කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග | පවුලේ වියදම් අඩු කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග | සමාජ සංවර්ධන හා අධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාකාරකම් | දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමට ගත් උපාය මාර්ග | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු පදනම් කරගෙන පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත්වන පවුල් පිළිබඳ වසම් ප්‍රගතිය FDPV2 මේ සමඟ අමුණා ඇත.

අත්සන :

සමෘද්ධි සංවර්ධන නිළධාරි නම :

වසම :

දිනය :

## <u>පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ වසම් ප්‍රගතිය</u>

**( FDPV 01 හි තොරතුරු පදනම් කරගෙන FDPV 2.1 නිර්නායක අනුව FDPV 02 සකස්කළ යුතුය.මෙම වාර්තාව සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් කලාප කලමනාකරු වෙත මාසිකව ලබා දිය යුතුය.)**

**වසම:**
**සමෘද්ධිලාභී පවුල් ගණන :**
**සමෘද්ධි නොලබන අඩු ආදායම්ලාභි පවුල් ගණන :**
**අදාළ මාසය :**

| **පවුල් වර්ගීකරණය** | **පවුල් ගණන** |
|---|---|
| 1. පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | |
| 2. අර්ධ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | |
| 3. තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් | |
| 4. සවිබල ගැන්විය නොහැකි පවුල් | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

අත්සන :

සමෘද්ධි සංවර්ධන නිළධාරි නම :

වසම :

දිනය :

ඉහත පවුල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වීම තුළ පොහොසත් වන පවුල් පහත නිර්ණායක අනුව වර්ග කර ඇත.

**නිර්ණායක :**

1. **ආර්ථික**
2. **සාමාජීය හා සංස්කෘතික**
3. **තීරණ ගැනීම**
4. **ශාරීරික**
5. **මානසික**
6. **පාරිසරික**
7. **නෛතික**

1) **පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් - ආර්ථික සවිබලගැන්වීමත් සමඟ ඉහත නිර්ණායක 5 ක් හෝ 6 ක් සම්පූර්ණ වූ පවුල්**
2) **අර්ධ වශයෙන්සවිබල ගැන්වූ පවුල් - ආර්ථික සවිබලගැන්වීමත් සමඟ ඉහත නිර්ණායක 4 ක් සම්පූර්ණ වූ පවුල්**
3) **තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් - - ආර්ථික සවිබලගැන්වීමත් සමඟ ඉහත නිර්ණායක 3 ක් හෝ ඊට අඩු පවුල්**
4) **සවිබල ගැන්විය නොහැකි පවුල් - පැවිදි වූ, රෝගි වූ, වයස් ගත වූ, පූර්ණ වශයෙන් අබල දුබල වූ, මානසික වශයෙන් දුර්වලවූ පවුල් මෙම ගණයට වැටේ.**

## පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ කලාපීය ප්‍රගතිය

**(මෙම වාර්තාව FDPV 02 අනුව සකස් කල යුතුය.බ්‍රහස්පතින්දා දින පැවැත්වෙන සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ කලාපීය සති ප්‍රගති සමාලෝචනයේදී කලාප කලමනාකරු විසින් ප්‍රගතිය සාකච්ජා කල යුතුය)**

**සමෘද්ධි බැංකුව :**

**ප්‍රා.ලේ.කොට්ඨාශය :**

**මාසය :**

| ග්‍රාම නිළධාරි වසම | සමෘද්ධි ප්‍රතිලාභි පවුල් ගණන | සමෘද්ධි ප්‍රතිලාභ නොලබනඅඩු ආදායම්ලාභි පවුල් | පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | අර්ධ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් | සවිබල ගැන්විය නොහැකි පවුල් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් ලබා දුන් වසම් ප්‍රගතිය ඇමුණුම පදනම් කරගෙන මෙම කලාපීය ප්‍රගතිය සකස් කළ බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

සකස් කළේ :
නම:
තනතුර:
පරීක්ෂා කලේ :

නම :
තනතුර :
කළමණාකරුගේ අත්සන :

නම :
දිනය :

**<u>පවුල් සංවර්ධන සැලැස්ම තුළින් පොහොසත් වන පවුල් පිළිබඳ ප්‍රා.ලේ. කොට්ඨාශ ප්‍රගතිය</u> (මෙම වාර්තාව FDPZ 03 අනුව සකස් කල යුතුය.සෑම මසකම ප්‍රා.ලේ.කොට්ඨාශය තුල පැවැත්වෙන සමෘද්ධි මාසික ප්‍රගති සමාලෝචනයේදී ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රගතිය සාකච්ජා කල යුතුය)**

**ප්‍රා.ලේ.කොට්ඨාශය :**

**මාසය :**

| සමෘද්ධි බැංකුවේ නම | සමෘද්ධි ප්‍රතිලාභි පවුල් ගණන | සමෘද්ධි ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභි පවුල් | පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | අර්ධ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් | සවිබල ගැන්විය නොහැකි පවුල් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

සමෘද්ධි බැංකු කළමණාකරු විසින් ලබා දුන් කලාපීය ප්‍රගතිය ඇමුණුම පදනම් කරගෙන මෙම ප්‍රා.ලේ.කො. ප්‍රගතිය සකස් කළ බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

සකස් කළේ :
නම:
තනතුර:

පරීක්ෂා කලේ :
නම :
තනතුර :

කළමණාකරුගේ අත්සන :
නම :
දිනය:

## පවුල් සංවර්ධන සැලැස්ම තුළින් සවිබලගැන්වූ පවුල් පිළිබඳ දිස්ත්‍රික් ප්‍රගතිය

**(මෙම වාර්තාව FDPD 04 අනුව සකස් කල යුතුය.ප්‍රාදේශීය පුහුණු කරුවන් සඳහා පැවැත්වන ත්‍රෛයි මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනයේදී සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් ප්‍රගතිය සාකච්ඡා කල යුතුය)**

**දිස්ත්‍රික්කය :**

**මාසය :**

| ප්‍රා.ලේ. කො | සමෘද්ධි ප්‍රතිලාභි පවුල් ගණන | සමෘද්ධි ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභි පවුල් | පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | අර්ධ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් | සවිබල ගැන්විය නොහැකි පවුල් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

ප්‍රා.ලේ.කො. මට්ටමින් ලබා දුන් ප්‍රා.ලේ.කො. ප්‍රගතිය ඇමුණුම පදනම් කරගෙන මෙම දිස්ත්‍රික් ප්‍රගතිය සකස් කළ බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

සකස් කළේ :
නම:
තනතුර:

පරීක්ෂා කලේ :
නම :
තනතුර :

කළමණාකරුගේ අත්සන :
නම :
දිනය:

**<u>පවුල් සංවර්ධන සැලැස්ම තුළින් සවිබලගැන්වූ පවුල් පිළිබඳ ජාතික මට්ටමේ ප්‍රගතිය</u>**

**(මෙම වාර්තාව FDP DIS 5අනුව සකස් කල යුතුය.සමෘද්ධි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් පුහුණු කළමනාකරුවන් සඳහා පැවැත්වන ත්‍රෛයි මාසික ජාතික ප්‍රගති සමාලෝචනයේදී සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රගතිය සාකච්ඡා කල යුතුය)**

**මාසය :**

| දිස්ත්‍රික්කය | සමෘද්ධි ප්‍රතිලාභි පවුල් ගණන | සමෘද්ධි ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභි පවුල් | පූර්ණ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | අර්ධ වශයෙන් සවිබල ගැන්වූ පවුල් | තාවකාලිකව සවිබල ගැන්වූ පවුල් | සවිබල ගැන්විය නොහැකි පවුල් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ලබා දුන් දිස්ත්‍රික් ප්‍රගතිය ඇමුණුම පදනම් කරගෙන මෙම ජාතික මට්ටම් ප්‍රගතිය සකස් කළ බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

සකස් කළේ :
නම:
තනතුර:

පරීක්ෂා කලේ :
නම :
තනතුර :

කළමණාකරුගේ අත්සන :
නම :
දිනය: